## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-උතුරු මැද පළාත
## වෑන් රථ 01 ක් කුලියට ගැනීම

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා ඩීසල් වෑන් රථ 01 ක් කුලියට ගැනීමට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2021.10.27 දින ප.ව.02.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මීට අදාල කොන්දේසි හා අදාල සුදුසුකම් පහත පරිදි වේ.

i. නවතම (Brand New) හා අලුත්වැඩියා කරන ලද (Recondition) වෑන් රථ පමණක් වීම.
ii. අවම වශයෙන් ආසන 08 ක් තිබිය යුතු අතර එම ආසන සුව පහසුවට සකස්කරන ලද සිරු මාරු කළහැකි වීම.
iii. ද්විත්ව වායු සමන සහිතවීම.
iv. වාහනයේ ප්‍රථම ලියාපදිංචිය වසර 09ක් තුළවීම.
v. වාහනය පූර්ණ රක්ෂණාවරණය කර තිබීම.
vi. වාහනයේ හිමිකරු විසින් රියදුරු හා ඉන්ධන සැපයිය යුතු අතර සියලුම සේවා හා අලුත්වැඩියාවන් ද ඔහු විසින්ම සිදුකළ යුතුය.
vii. මසකට අවම වශයෙන් කි.මී.1750 හා උපරිම වශයෙන් කි.මී.3500 ක් ධාවනය කළ යුතුය.
viii. වාහනයේ දෝෂයක් ඇති වූ විට සැපයුම්කරු ආදේශක වාහනයක් සැපයිය යුතුය.
ix. රියදුරු දීමනා ගෙවීමක් හෝ නවාතැන් පහසුකම් සැපයීමක් සිදු නොකෙරේ.

03. ඉහත සඳහන් ප්‍රමිතීන්ට අනුකූල වන සේ වෑන් රථයක් සැපයීමට හැකි සැපයුම්කරුවන් හට මේ සමඟ ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2021.10.27 වන දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරුමැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම කළහැකි වේ. අතින් ගෙනවිත් භාරදෙන්නේ නම් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්)ගේ නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය.ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කරන අතර එකී අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය.

04. මෙම ලංසු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
උතුරුමැද පළාත,
අනුරාධපුර.

2021.10.19 වැනි දින

අයදුම් පත්‍රයයි

<u>වෑන් රථයක් කුලියට ගැනීම</u>
<u>2021.12.31 දින දක්වා</u>
<u>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>
<u>උතුරුමැද පළාත.</u>

01. ධාවන කිලෝමීටර් එකක් ධාවනය සඳහා වන මිල:-
රුපියල්.........................................................................................(ඉලක්කමෙන්)
අකුරින්.........................................................................................................
02. වාහනයේ ලියාපදිංචි අංකය හා ප්‍රථම ලියාපදිංචි දිනය:-
...........................................................................................................
03. එන්ජිමේ සිලින්ඩර් ධාරිතාවය:-...........................................................................
04. එන්ජින් හා චැසි අංකය:-..................................................................................
05. වර්තමාන අයිතිකරුගේ නම:-..............................................................................
    i. ස්ථිර ලිපිනය:-......................................................................................
    ii. හැඳුනුම්පත් අංකය:-...............................................................................
06. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දුර:-කි.මී.......................................................
07. ඉන්ධන වර්ගය:-........................................
08. ආසන ගණන:-..........................................
09. 2021 වර්ෂයේ පූර්ණ රක්ෂණය ලබාගත් ආයතනය හා අවසන් වන දිනය:-.....................
10. 2021 වර්ෂයට අදාලව වාහන ආදායම් බලපත්‍රය ලබාගත් ස්ථානය හා බලපත්‍ර අංකය:-
...........................................................................................................

මා හට අයිති ඉහත සඳහන් වාහනය පිළිබඳව ලබාදී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

අත්සන..........................    දිනය..........................

<u>උපදෙස් හා කොන්දේසි</u>

- ❖ මාසිකව ධාවනය කිරීමට අපේක්ෂිත දුර අවමය කි.මී.1750 ක් හා උපරිමය 3500 පමණ වේ.
- ❖ මෝටර් වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- ❖ පූර්ණ රක්ෂණ සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- ❖ 2021 වර්ෂයේ වාහන ආදායම් බලපත්‍රය ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- ❖ පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- ❖ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ඇණවුම භාරදුන් දින සිට 2021.12.31 දක්වා වලංගු විය යුතුය. එම කාලය අතරතුර කිසියම් හෝ හේතුවක් නිසා මිල ගණන් වෙනස් කළ නොහැක.